ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1979 අංක 39 දරන නිවාස සහ නගර සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 20 යි තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 39 දරන නිවාස සහ නගර සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 125/78

නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 39 දරන නිවාස සහ නගර සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ උපලේඛනයේ 1 වන රීතියෙහි "(පූජනීය ස්ථානයක් නොවන) ගොඩනැගිල්ලක් වීථියක පිහිටා තිබෙන අවස්ථාවක" යන වචනවල සිට "නොවිය යුතුය." යන වචන දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 268 වන අධිකාරයෙහි උපලේඛනය සංශෝධනය කිරීම.

"(පූජනීය ස්ථානයක් නොවන) ගොඩනැගිල්ලක් වීථියක පිහිටා තිබෙන අවස්ථාවක, එම ගොඩනැගිල්ලේ ඉදිරිපස කිසිදු කොටසකින් ප්‍රස්තුත ගොඩනැගිල්ලෙහි සිට වඩා ඈත් වූ වීථි පාර්ශ්වයේ වීථි ඉදිරිපසෙහි සිට අඳින ලද, රේඛා විය යුතු, එම ගොඩනැගිල්ලේ පහළ ම මාලයේ තලයට $63\frac{1}{2}°$ ක කෝණයකට වීථිය හරහා අඳින ලද කල්පිත රේඛා පෙළෙහි කිසියම් රේඛාවක් ඡේදනය නොවිය යුතු ය;".

ජ 41784—12,300 (79/05)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනය පටන් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.